# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2405/34 – 2024 ඔක්තෝබර් මස 10 වැනි බ්‍රහස්පතින්දා – 2024.10.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/87.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.06.09 දිනැති හා අංක 2335/23 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.06.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කල්මුණේ 02, ආර්. කේ. එම්. පාර, අංක 05 හි පදිංචි ඩී. කේ. නන්දනී තිලකරත්න මිය සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති A/44/2023 හා 2024.06.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 සැප්තැම්බර් මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ප්‍රදානය

**කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය: A 44/2023
IR/COM/03/2020/87

ඩී. කේ. නන්දනී තිලකරත්න,
අංක 05,
ආර්. කේ. එම්. පාර,
කල්මුණේ - 02.

*ඉල්ලුම්කාරිය*

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*වගඋත්තරකරු*

වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 11 වැනි දින දී ය.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

ඉහත නම් සඳහන් ඉල්ලුම්කරු සහ වගඋත්තරකරු අතර පවතින බේරුම්කරණය මගින් විසඳීමට අපේක්ෂිත මෙම ආරාවුලට තුඩු දුන් කාරණය පහත පරිදි වේ.

“ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ඩී. කේ. නන්දනී තිලකරත්න මියට 2013.09.20 දින පැවති සම්මුඛ පරීක්ෂණයේදී විනය විභාග නිලධාරී ආවරණ තනතුරට කරන ලද පත්කිරීම අනුව V ශ්‍රේණියට අදාළ වැටුප හිමි ද, හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.’’

2023.06.21 දිනැති නියෝගය අනුව පළමු පාර්ශ්වය විසින් 2023.07.10 වැනි දිනැතිව සිය *මූලික ප්‍රකාශය* සහකාර කම්කරු කොමසාරිස්තුමිය වෙත යොමු කරමින් වෙනත් දෑ අතර,

1. 2013.09.06 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණය අනුව 2013.12.23 වැනි දිනැති පත්වීමේ ලිපිය මගින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරී තනතුර ආවරණය කිරීමට පත්කරන ලද බවත්, එකී පත්වීම ලබාදෙන ලද්දේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2013 අංක 5 දරන මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍ර ලිපිය අනුව බවත්,

2. මෙම ඉල්ලීම කරනු ලබන දිනය වන විටත් දෙන ලද ආවරණ පත්වීම ස්ථිර නොකර තනතුරට අදාළ වැටුප් ලබා නොදුන්න ද, තමන් විනය විභාග නිළධාරි තනතුරට අදාළව සේවය සපයන බවත්,

3. ඉන්පසුව මෙම ආවරණ පත්වීම ස්ථිර නොකිරීම මත ඒ සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර තැන මගින් ශ්‍රී ලංගම සභාපතිතුමා වෙත දෙවතාවක් අභියාචන යොමු කරන ලද නමුත් ඊට පිළිතුරු නොලැබුණ බවත්,

4. එමෙන්ම විවිධ අවස්ථාවන්වල දී පත්වූ ප්‍රවාහන අමාත්‍යවරුන්ට ද, එවකට ජනාධිපති සහ අගමැතිතුමන් වෙත තමන්ට සිදුවූ අසාධාරණය පිළිබඳව දැනුවත් කළ බවත්,

5. 2013.09.06 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණය මත විනය විභාග නිලධාරි තනතුරේ වැඩ ආවරණය කිරීමට තමන් සමග තෝරාගත් අනෙක් හතරදෙනා මේ වන විට එම තනතුරේ ස්ථිරකොට V වැනි ශ්‍රේණියේ ප්‍රතිෂ්ඨාපනය කර ඇති බවත්,

6. එම කාරණා හේතුකොටගෙන අසාමාන්‍ය ලෙස සැලකීම සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරන ලද බවත්,

7. එසේ කිරීම තුළින් ඉල්ලුම්කාරියට අසමාන ලෙස සලකා මෙම කාර්මික ආරාවුල හටගෙන ඇති බවත්,

ප්‍රකාශ කර ඇති අතර, ඉල්ලුම්පත සමග පැ. 1 සිට පැ. 19 දක්වා ලේඛන ලකුණු කර ඇත.

ඒ සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් 2023.07.19 වැනි දිනැතිව ඉදිරිපත් කර ඇති පිළිතුරු ප්‍රකාශයේ (මුල් ප්‍රකාශයේ) වෙනත් දෑ අතර,

1. ඉල්ලුම්කාරිය මුල්වරට 1995.01.25 දින කොන්ත්‍රාත් පදනම මත යතුරු ලේඛිකා තනතුරට පත්ව ඇති බවත්, 1996.01.17 දිනැති ලිපිය මගින් 1996.01.01 දින සිට අනියම් යතුරු ලේඛිකා ලෙස පත්වීම් ලබමින් 1996.03.15 දින සිට VIII B ශ්‍රේණියේ ස්ථිර යතුරු ලේඛිකා තනතුරට පත්වීම් ලබා ඇති බවත්,

2. ප්‍රධාන මානව සම්පත් කළමනාකාරතැනගේ 2013.12.23 දිනැති හා අංක ශ්‍රී ලංගම/මාසක/ආවරණ/විධා/42/2013 දිනැති ලිපිය මගින් විනය විභාග නිළධාරි තනතුර ආවරණය කිරීම සඳහා පත්කර ඇති බවත්,

3. වගඋත්තරකරුට එරෙහිව පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SCFR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවල දී ලබා දී ඇති අතුරු නියෝග අනුව ආයතනයේ පැවැත්ම අවහිරයකින් තොරව පවත්වාගෙන යාම සඳහා (smooth functioning of the institution) පහත කොන්දේසිවලට යටත්ව ආවරණ ලිපි ලබාදිය හැකි බව තීරණය කර ඇති බවත්, එනම් :

   i. එකී පත්වීම් ලබාදීමට පවතින සේවා අවශ්‍යතාවය.
   ii. එම පත්වීම් උසස්වීමක ස්වභාවයක් නොදැරිය යුතුය.
   iii. එම පත්වීම මගින් වැටුප් වැඩිවීමක් නොවිය යුතුය.
   iv. එම පත්වීම් ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබානොගන්නේ නම් එලෙස පත්වීම් ලබාදුන් ලැයිස්තුව මීළඟ නඩු දිනයට සතියකට පෙර මෝසමක් මගින් අධිකරණයේ ගෙනුකළ යුතුය.

4. ඉල්ලුම්කාරිය දැනටමත් VIII B ශ්‍රේණියේ සිටින සේවකයෙක් වන අතර විනය විභාග නිළධාරි තනතුරට පත්වන සේවකයන් අවම ලෙස V වන ශ්‍රේණියේ නිළධාරියෙකු විය යුතු බවත්, එම නිසා මෙම ඉල්ලුම්කාරියට උසස්වීමක් ලැබෙන ආකාරයේ ආවරණ පත්වීම ස්ථිර කිරීමට වගඋත්තරකරුට හැකියාවක් නොමැති බවත්,

5. වගඋත්තරකරු විසින් ආයතනික ව්‍යුහය සහ උසස්කිරීමේ පටිපාටිය අනුමත කරගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග කටයුතු කරමින් පවතින බවත්, සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගැනීමේ ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින බවත්, එම නිසා මෙම අවස්ථාවේ මෙම ක්‍රියාවලියට බාහිරව හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදීමට වගඋත්තරකරුට නොහැකි බවත්,

6. ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරි ආවරණ තනතුරට පත්වන අවස්ථාව වනවිට මූලික වැටුප රු. 13,865/- ක් වන බවත්,

7. ඉල්ලුම්කාරිය සම්බන්ධයෙන් වගඋත්තරකරු විසින් කිසිදු අසාධාරණ ක්‍රියාවලියක් සිදුකර නොමැති බවත් සත්භාවයෙන් කටයුතු කර ඇති බවත් එහෙයින් වගඋත්තරකරුට එරෙහිව නඩු නිමිත්තක් උපචය වී නොමැති බවත්,

8. ඉල්ලුම්කාරියගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කරන ලෙසත්,

9. නඩු ගාස්තු සහ ගරු කාර්මික අධිකරණයට උචිතයැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදෙන ලෙසත්,

ප්‍රකාශ කර ඇත.

ඉන්පසුව වගඋත්තරකරු විසින් 2023.07.25 වැනි දිනැති දෙවන ප්‍රකාශය ගොනු කරමින් ඉහත සඳහන් කළ සිය පළමු ප්‍රකාශයේ සඳහන් කරුණුම නැවත පුනරුච්ඡාරණය කරමින් ඉදිරිපත් කර ඇති දෙවන ප්‍රකාශයේ වෙනත් දෑ අතර,

1. ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශයේ පළමු හා දෙවන සම්ප්‍රකාශ පිළිගන්නා බවත්,

2. ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශයේ 1, 2, 3, 4, 5, 6, 7 සහ 8 සම්ප්‍රකාශයන් පිළිගන්නා බවත්,

3. ඉල්ලුම්කාරියට විනය විභාග නිලධාරි (ආවරණ) පත්වීමක් ලබාදී ඇති බැවින් එකී තනතුරේ කටයුතු අනලස්ව ඉටුකිරීම ඉල්ලුම්කාරිය සතු වගකීමක් බවත්,

4. පළමු ප්‍රකාශයේ 13, 14 සහ 15 සම්ප්‍රකාශයන් නොදන්නා බැවින් ප්‍රතික්ෂේප කරන බවත්,

5. පළමු ප්‍රකාශයේ 16 වන සම්ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන අතර, ශ්‍රී ලංගම පුහුණු කොට්ඨාස විසින් පවත්වනු ලබන වැඩමුළු සඳහා සේවකයන් යොමු කරනු ලබන බවත්, ඒ අනුව ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරි ආවරණ තනතුරේ කටයුතු කරන බැවින් සහභාගිත්වය වෙනුවෙන් සහතික පිරිනැමූ බවත්,

6. පළමු ප්‍රකාශයේ 17 සම්ප්‍රකාශය ප්‍රතික්ෂේප කරන බවත්,

7. ඉල්ලුම්කාරියගේ ඉල්ලුම් පත්‍රය නිශ්ප්‍රභ කරන ලෙසත්, නඩු ගාස්තු හා ගරු කාර්මික අධිකරණයට උචිතයැයි හැඟෙන වෙනත් සහ වැඩිමනත් සහන ලබාදෙන ලෙසත්,

ප්‍රකාශ කර ඇත.

අනතුරුව, ඉල්ලුම්කාරිය විසින් 2023.08.14 වන දිනැතිව ප්‍රතිඋත්තර ප්‍රකාශය (දෙවන ප්‍රකාශය) ඉදිරිපත් කරමින් වෙනත් දෑ අතර,

1. වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ දෙවන ඡේදයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින් තමන් කොන්ත්‍රාත් යතුරු ලේඛිකාවක ලෙස 1995.02.01 දින සිට පත්වීම් ලබාඇති බවත්,

2. වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ තුන්වන ඡේදයේ සඳහන් කරුණු පිළිගන්නා බවත්,

3. වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ හතරවන ඡේදයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමින් තමන් 1997.03.15 දින සිට VIII B යතුරු ලිපිකාරිණී තනතුරේ ස්ථිර කර ඇති බවත්,

4. පළමු ප්‍රකාශයේ හයවන ඡේදයේ සඳහන් කරුණු තරයේ ප්‍රතික්ෂේප කරමින් තමන් ප්‍රධාන මානව සම්පත් කළමණාකාරතැනගේ 2013.12.23 දිනැති හා අංක ශ්‍රී ලංගම/මාසක/ආවරණ/විධා/42/2013 දරන ලිපිය මගින් විනය විභාග නිළධාරී තනතුරට පත්කර ඇති බවත්, 2019.07.17 සහ 2019.09.24 දින දක්වා එම තනතුරෙහි වැඩ පවරමින් සේවය ලබාගෙන ඇති බවත්,

5. යම් සේවකයෙකු යම් ආවරණ කාර්යයක් කරනු ලැබුවේ නම් එම සේවකයා මාස 03ක් ඇතුළත එම තනතුරේ ස්ථිරකළ යුතු බවත්, පොදු කම්කරු නීතිය යටතේ මාස 06ක් අඛණ්ඩව සේවය කළේ නම් එම තනතුරේ ස්ථිර සේවකයෙකු ලෙස පිළිගන්නා අතර, එම තනතුර ආවරණය කර මාස 06 ක් පසු එම තනතුරට හිමි වැටුප් පාදයේ පිහිටුවිය යුතු බවත්,

6. නමුත්, එසේ නොකිරීමෙන් ඉල්ලුම්කාරියට මහත් අසාධාරණයක් සිදුව ඇති බවත්, තම තනතුරේ කටයුතු කිරීමේදී එම තනතුර කරනු ලබන අනෙකුත් සේවකයින්ගේ අයිතිවාසිකම් පරස්පර විරෝධී ලෙස සැලකීම වැරදි සහගත බවත්,

7. වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ 06 වන ඡේදයේ පෙන්වනු ලබන SC/FR/239/2019 යන නඩුව ඉල්ලුම්කාරියට බල නොපාන බවත්, විනය විභාග නිළධාරී තනතුර V ශ්‍රේණියේ තනතුරක් බැවින් 2013.12.23 දින සිට මාස 06ක් පසුවීමෙන් අනතුරුව, V ශ්‍රේණියේ විභාග නිලධාරී වැටුප් තලයේ පිහිටුවමින් සේවය ස්ථිරකළ යුතු බවත්,

8. වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ 07 වන ඡේදයේ සඳහන් කරුණු තරයේ ප්‍රතික්ෂේප කරන බවත්, ඉල්ලුම්කාරියට එපරිද්දෙන් එම වැටුප් ව්‍යුහය මේ වන තෙක් ශ්‍රී ලංගම කාර්ය මණ්ඩලයට අනුගතකර නොමැති හෙයින් ඉල්ලුම්කාරිය සේවය කළ එම තනතුරේ වැටුප් පාදයේ පිහිටුවීමට කිසිදු බාධාවක් නොමැති බවත්,

9. වගඋත්තරකරුගේ පළමු ප්‍රකාශයේ 08 වන ඡේදයේ සඳහන් කරුණු තරයේ ප්‍රතික්ෂේප කරන බවත්, ඉල්ලුම්කාරිය V ශ්‍රේණියට අයත් විනය විභාග නිලධාරී තනතුරේ සියලු කාර්යයන් කරගෙන යන බවත්, තම මූලික වැටුප රු. 13,865ක් නොව 2014.03.15 දින සිට රු. 15,765ක් බව පැ18 ලේඛනය මගින් තහවුරු වන බවත්,

10. පළමු ප්‍රකාශයේ 09 වන ඡේදයේ කරුණු ප්‍රතික්ෂේප කරන බවත්, ඉල්ලුම්කාරිය V ශ්‍රේණියේ විනය විභාග නිලධාරී වශයෙන් කටයුතු කරන බවත්, ශ්‍රී ලංගම නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලයේ විභාග නිලධාරීන් 04 දෙනෙකු කටයුතු කරන අතර, එම විභාග නිලධාරීන් 04 දෙනාගෙන් ඉල්ලුම්කාරියට පමණක් තනතුරට අදාල වැටුප් නොගෙවා අදාල විභාග නිලධාරී තනතුරේ සේවය ලබාගනිමින් සේවා ස්ථිරතාවයක් නොකර එම ප්‍රාදේශිකයේ අනෙක් විනය විභාග නිලධාරින් ඉල්ලුම්කාරියට පසුව සේවයට බඳවාගෙන ඇති බවත්,

11. 2013.12.23 දින සිට අදාල වැටුප් තලයේ නොපිහිටුවා සේවය ගැනීම අයුක්ති අසාධාරණ කම්කරු පිළිවෙත් විරෝධී ක්‍රියාවන් බවත්, එබැවින් ඉල්ලුම්කාරියගේ ඉල්ලුම්පත්‍රය පිළිගන්නා ලෙසත්, 2013.12.23 දින සිට V ශ්‍රේණියේ විනය විභාග නිලධාරී තනතුරේ පිහිටුවා නොගෙවන ලද හිඟ වැටුප, වරප්‍රසාද නඩුගාස්තු සහ ගරු අධිකරණයට උචිතයැයි හැඟෙන වැඩිමනත් සහන ලබාදෙන ලෙසත්,

ප්‍රකාශ කර ඇත.

අනතුරුව, ඉල්ලුම්කාරිය විසින් 2023.08.14 වන දිනැතිව දෙවන උත්තර ප්‍රකාශය ඉදිරිපත් කරමින් වෙනත් දෑ අතර,

1. ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශය පිළිගෙන ඇති බවත්,

2. ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශයේ දෙවන කරුණ වගඋත්තරකරු පිළිගෙන ඇති බවත්,

3. ඉල්ලුම්කාරියගේ පළමු ප්‍රකාශයේ 01, 02, 03, 04, 05, 06, 07, 08, 09, 10 සහ 12 යන ඡේද වගඋත්තරකරු පිළිගෙන ඇති බවත්,

4. ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරී (ආවරණ) තනතුරේ අනලස්ව කාර්යය ඉටුකර ඇතිබව වගඋත්තරකරු පිළිගෙන ඇති බවත්,

5. එසේ වුවද, II වන ඡේදයේ සඳහන් කරුණු තම දෙවන ප්‍රකාශය මගින් පිළිනොගන්නා බවක් හෝ පිළිගන්නා බවක් සඳහන් නොකර එයට ඉල්ලුම්කාරිය විසින් II වන ඡේදයේ සඳහන් කරුණු තහවුරු කිරීමට පැ12 ලේඛනය අමුණා තිබියදී හිතාමතා ඉල්ලුම්කාරියට අසාධාරණයක් කිරීමේ අදහසින් එය මගහැර අනෙකුත් ප්‍රකාශනයන්ට උත්තරදීම වැරදි සහගත බවත්,

6. ඉල්ලුම්කාරියගේ 13, 14, 15 ප්‍රකාශයන් නොදන්නා බව ප්‍රකාශ කර ඇති අතර, නැවත එම ප්‍රකාශයක් ඉල්ලුම්කාරිය විසින් තම දෙවනි ප්‍රකාශනයෙන් ගරු අධිකරණයට යොමු කරන බවත්,

7. 08 ඡේදයේ සඳහන් කරුණු වගඋත්තරකරු ප්‍රතික්ෂේප කරන බව ඉල්ලුම්කාරිය බැහැර කරන බවත්, ඉල්ලුම්කාරියට සේවා ඇගයීමක් වශයෙන් වැඩමුළුව සාර්ථක කිරීම වෙනුවෙන් පැ18 ලේඛනය ඉදිරිපත් කර ඇතත්, ඉල්ලුම්කාරියගේ සේවය ඇගයීම වගඋත්තරකරු විසින් හිතාමතා වෙනත් කරුණු සඟවා එකී සහතික පිරිනැමීම සේවය ඇගයීමක් නොව ඇයගේ කාර්ය ඉටු කිරීම සඳහා පමණක් බව සඳහන් කර ඇති බවත්,

8. 09 ඡේදයේ සඳහන් කරුණු වගඋත්තරකරු ප්‍රතික්ෂේප කර ඇති බවත්, ඉල්ලුම්කාරිය 2013.12.23 දින පටන් එකී පත්වීම ප්‍රකාරව නැගෙනහිර ප්‍රාදේශිකයන්ට අයත් ඩිපෝවන්හි විනය ලිපිගොනු ලිඛිතව භාරගෙන විභාග පවත්වමින් සේවක විෂමාචාර සඳහා නිර්දේශ ලබාදුන් බවත්, එකී නිර්දේශ මත ශ්‍රීලංගම සහකාර මානව සම්පත් කළමනාකරු (විනය) අදාල නියෝග නිකුත් කරමින් ඉල්ලුම්කාරිය ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මකකළ බවත්, V ශ්‍රේණියේ අනෙකුත් විභාග නිලධාරින් කරනු ලබන කාර්යයන්ට සමානව කටයුතුකළ බවත්,

9. එසේ වුවද, V ශ්‍රේණියේ අනෙකුත් විභාග නිලධාරීන්ට ගෙවනු ලබන වැටුප හා ඊට අදාල වරප්‍රසාද කිසිවක් නොගෙවීම අයුක්ති සහගත හා අසාධාරණ වන බවත්, 2013 නීත්‍යානුකූලව සිදුකළ පත්වීමක් ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ 2019 වර්ෂයේ නිකුත්කළ අතුරු තීන්දුවකින් නොබැඳෙන බවත්,

10. ඉල්ලුම්කාරියගේ මූලික වැටුප රු. 15,865ක් බැවින් 10 වන ඡේදයේ කරුණු ප්‍රතික්ෂේප කරන බවත්, ඉල්ලුම්කාරියට සිදුව ඇති අසාධාරණය වෙනුවෙන් සාධාරණයක් ඉටුකරදෙන ලෙසත්

ප්‍රකාශ කර ඇත.

ඉල්ලුම්කාරියගේ සහ වගඋත්තරකරුගේ උත්තරවාද මගින් පහත සඳහන් කරුණු දෙපාර්ශවය විසින් පිළිගෙන ඇත.

- ඉල්ලුම්කාරිය මුල්වරට කොන්ත්‍රාත් පදනම මත යතුරු ලේඛිකා තනතුරට පත්ව ඇති බවත්, පසුව අනියම් යතුරු ලේඛිකා ලෙස පත්වීම් ලබා ඇති බවත් පිළිගනී.

- ඉල්ලුම්කාරිය මූලිකව VIII B ශ්‍රේණියේ යතුරු ලේඛිකා තනතුරට ස්ථිර පත්වීම් ලද බව පිළිගනී.

- ඉල්ලුම්කාරිය වන ඩී.කේ. නන්දනී තිලකරත්න මහත්මිය 2013.09.06 දිනැති සම්මුඛ පරීක්ෂණයට මුහුණදී 2013.12.23 දිනැති හා අංක ශ්‍රී ලංගම/මාසක/ආවරණ/විධා/42/2013 දරණ ලිපිය මගින් V ශ්‍රේණියේ විනය විභාග නිළධාරී තනතුර ආවරණය කිරීමට පත්වීමක් ලබාදී ඇතිබව පිළිගනී.

- ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරි (ආවරණ) තනතුරේ අනලස්ව කාර්යය ඉටුකර ඇතිබව පිළිගනී.

- ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරී තනතුරේ සේවය කිරීම සඳහා පළමුව 2014.02.19 දින ශ්‍රීලංගම-නැගෙනහිර ප්‍රාදේශිකයේ අම්පාර ඩිපෝවට අනුයුක්තකළ බවත්, ඉන්පසු 2016.04.18 දින අම්පාර ඩිපෝවේ කටයුතුවලට අමතරව ත්‍රිකුණාමලය, මුතූර්, කින්නියා සහ වාහර ඩිපෝවලද විනය විභාග නිලධාරී ලෙස කටයුතුකළ බවත් පිළිගනී.

- ත්‍රිකුණාමලය, මුතූර්, කින්නියා සහ වාහර ඩිපෝ දෙමළ භාෂාවෙන් කටයුතු කරන බවත්, විනය විභාග නිලධාරී වශයෙන් සිංහල හා දෙමළ භාෂාවෙන් ලිපිගොනු විභාග කිරීම, නඩත්තු කිරීමද විනය විභාග කටයුතුවලට අමතරව පැවරී තිබූ බව පිළිගනී.

ඉහත කී උත්තරවාද හා පිළිගැනීම් මත ඇරඹී සාක්ෂි විභාගයේදී, ඉල්ලුම්කාරිය 2023.10.17, 2023.11.02, 2023.11.21 මූලික ප්‍රශ්න, හරස් ප්‍රශ්නවලට භාජනය කිරීමෙන් අනතුරුව නැවත ප්‍රශ්න ඇසීමකින් තොරව දෙවන සාක්ෂිකරු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය මුදල් කළමනාකාර සමන් බණ්ඩාර රත්නායක මහතා 2024.02.28 සාක්ෂියට කැඳවන ලදී. එහිදී සාක්ෂිකරුගෙන් මූලික ප්‍රශ්න, හරස් ප්‍රශ්න අසා පැ1 සිට පැ24 දක්වා ලේඛන ලකුණු කරමින් පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කර ඇත.

අනතුරුව, වගඋත්තරකරු වෙනුවෙන් එකම සාක්ෂිකරු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කාර්මික සබඳතා - කාර්යය පැවරුම්) ඩී.එස්.තුඩුගල මහතා 2024.04.08 කැඳවමින් මූලික සාක්ෂි, හරස් ප්‍රශ්න සහ නැවත ප්‍රශ්නවලට ලක්කරමින් R1 සිට R13 දක්වා ලේඛන ලකුණුකර දෙවන පාර්ශ්වයේ නඩුව අවසන් කර ඇත.

ඉහත සඳහන් එක් එක් කරුණු මෙම ආරාවුලට අදාල සාක්ෂි විභාගයේදී කොපමණ දුරට වගඋත්තරකරු විසින් පිළිගෙන තිබේද එසේත් නැතහොත් ඉල්ලුම්කාරිය විසින් ඔප්පු කර තිබේද යන්න විමසා සිටිමි. ඒ අනුව, ඉල්ලුම්කාරිය විසින් අයැද ඇති කිනම් සහන ප්‍රදානය කළ හැක්කේද සහ කිනම් සහන බැහැරකළ යුත්තේද යන්න තීරණය වන අතර, විසඳිය යුතු ප්‍රධාන කරුණු පහත සඳහන් පරිදි වේ.

01. ඉල්ලුම්කාරිය 2013.09.06 දින පැවති සම්මුඛ පරීක්ෂණය ප්‍රකාරව 2013.12.23 දින විනය විභාග නිලධාරී ආවරණ තනතුරට කරන ලද පත්කිරීම අනුව V වන ශ්‍රේණියේ එම තනතුරේ ස්ථිරකළ යුතුද? අදාල වැටුප හිමිද? එසේ ස්ථිර නොකිරීමෙන් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුවී තිබේද?

02. ඉල්ලුම්කාරියට හිමිවියයුතු සහන කවරේද?

බේරුම්කරු වශයෙන් මාගේ කාර්යභාර්ය වනුයේ පරීක්ෂණයේ ස්වභාවය, ආරාවුල ඉදිරිපත් කරනු ලබන අවස්ථාව වනවිට පාර්ශ්වයන්ගේ අයිතීන් හා වගකීම් සහ අයැද ඇති සහන මත සාධාරණ සහ යුක්ති සහගත *(just and equitable)* ප්‍රදානයක් ලබාදීමයි. එවැනි සාධාරණ සහ යුක්ති සහගත *(just and equitable)* ප්‍රදානයක් ලබාදීම සඳහා ඉහත කී විසඳිය යුතු ප්‍රශ්න පිළිබඳව එක්ව සහ/හෝ වෙන් වෙන්ව සවිස්තරාත්මකව විමසා බලනු ලබන අතර *Thirunavakarsu v. Siriwardena (1981) 1 SLR 185 at 191* නඩුව ප්‍රකාර බලතල ක්‍රියාවට නංවනු ඇත.

*"An industrial arbitrator has much wider powers both as regards scope of the inquiry and the kind of orders he can make than an arbitrator in civil law. In short, we can fairly say that arbitration under the industrial law intended to be even more liberal, informal, and flexible than the commercial arbitration"*

01. ඉල්ලුම්කාරිය 2013.09.06 දින පැවති සම්මුඛ පරීක්ෂණය ප්‍රකාරව 2013.12.23 දින විනය විභාග නිලධාරී ආවරණ තනතුරට කරන ලද පත්කිරීම අනුව V වන ශ්‍රේණියේ එම තනතුරේ ස්ථිරකළ යුතුද? අදාල වැටුප හිමිද? එසේ ස්ථිර නොකිරීමෙන් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුවී තිබේද?

වගඋත්තරකරුගේ එක් ස්ථාවරයක් වන්නේ විනය විභාග නිලධාරී තනතුරට පත්වන සේවකයින් අවම ලෙස V වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු බවත්, ඉල්ලුම්කාරිය දැනට සිටින්නේ viii B ශ්‍රේණියේ වන බවත්, එම නිසා ඉල්ලුම්කාරියට උසස්වීමක් ලැබෙන ආකාරයෙන් ආවරණ පත්වීම ස්ථිර කිරීමට හැකියාවක් නොමැති බවත්ය. කෙසේ නමුත්, පැ01 ලෙස ලකුණු කරන ලද චක්‍රලේඛයේ

විනය විභාග නිලධාරී තනතුරට අවශ්‍ය සුදුසුකම් යටතේ 1.6 කොටසේ (පැ01C) පැහැදිලිව සඳහන් කර ඇත්තේ viii ශ්‍රේණියේ යතුරු ලිපිකරුවන් ඇතුළුව විනය අංශයේ වසර 08ක පළපුරුද්ද ඇත්නම් අයදුම්කළ හැකි බවයි. තවද, වගඋත්තරකරුගේ ස්ථාවරය අනුව අයදුම්පත් කැඳවීමේදී මෙම විනය විභාග නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවිය යුතු අවම සුදුසුකම V වන ශ්‍රේණියේ සේවකයකු නම්, ඒ සඳහා ඉල්ලුම්පත් කැඳවීමේදී එකී සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට පමණක් අයදුම්පත් එවන ලෙස ඊට අදාල චක්‍රලේඛයේ සඳහන් කළ යුතුය.

එකී තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේදී ඊට අදාල පැ01 දරන චක්‍රලේඛයේද අදාල සුදුසුකම් සපුරා නොමැති සේවකයින්ගේ අයදුම්පත් ඉදිරිපත් නොකිරීමට ස්ථානභාර/අංශභාර නිලධාරී මහතුන් සහ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර තරයේ වගබලා ගතයුතු බවත්, විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විභාග ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්පත්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බවත් සඳහන්ව ඇති බවද නිරීක්ෂණය වන බැවින් ඉල්ලුම්කාරියගේ සුදුසුකම් පිළිබඳව සෑහීමට පත්ව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් එකී තනතුරට ඉල්ලුම්කාරිය පත්කොට ඇති බව පෙනීයයි.

අනෙක් අතට, ප්‍රධාන මානව සම්පත් කළමනාකාරතැනගේ අංක ශ්‍රීලංගම/මාසක/ආවරණ/විධා/42/2013 හා 2013.12.23 දිනැති ලිපිය මගින් ඉල්ලුම්කාරිය විනය විභාග නිළධාරි තනතුර ආවරණය කිරීම සඳහා පත්කර ඇතිබව උත්තරවාද මගින් ද වගඋත්තරකරු හබයකින් තොරව පිළිගෙන ඇත. ඉල්ලුම්කාරිය අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා නොතිබුණේ නම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉල්ලුම්කාරිය එම තනතුර සඳහා පත්නොකළ යුතුව තිබුණි.

තවද එසේ V වන ශ්‍රේණියේ විනය විභාග නිළධාරි තනතුරේ සේවය කිරීමේ දී සිය වගකීම් අනලස්ව ඉටුකළ බව වගඋත්තරකරු පිළිගෙන ඇත. එහිදී ඉල්ලුම්කාරිය සිංහල භාෂාවෙන් පමණක් නොව, තමන් අනුයුක්ත කළ ඩිපෝවල පරිපාලනය මත දෙමළ භාෂාවෙන් ද සිය කාර්යය ඉටුකර ඇති බව වගඋත්තරකරු පිළිගෙන ඇත. ඇය භාෂා දැනුමෙන් සන්නද්ධ හෙයින් ඇගේ සේවයේ අවශ්‍යතාවය ඉස්මතුව ඇති බවක් පෙනී යයි. ආවරණය කරනු ලබන රාජකාරිය නිසි පරිදි සිදුනොකළේ නම්, ඉල්ලුම්කාරිය එකී පත්වීම ප්‍රකාරව මේ දක්වා වැඩ ආවරණය කිරීමට අවස්ථාවක් උදා නොවනු ඇත.

අනෙක් අතට 2017 චක්‍රලේඛය ප්‍රකාරව V ශ්‍රේණියෙ ස්ථිර සේවය සඳහා අයදුම් නොකළ ද, ඉල්ලුම්කාරිය ආවරණ තනතුරේ හිඳිමින් ඊට සරිලන වැටුපක් හෝ දීමනාවක් හෝ නොමැතිව 2013.12.23 දින සිට ඉටුකළ කාර්යයේ වටිනාකම මත වගඋත්තරකරු විසින් මානුෂීය වශයෙන් සලකා එකී ශ්‍රේණියේ ස්ථිර කිරීමට යම් උත්සාහයක් දරා ඇති බව පෙනී යයි. විශේෂයෙන්ම R11 ලේඛන නිර්දේශය අනුව ඇය නිසි ශ්‍රේණියේ ස්ථිර කිරීමට වගඋත්තරකරුට හැකියාවක් ඇති බව තහවුරු වේ.

2024.04.08 වැනි දින සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා - කාර්යය පැවරුම්) 12 වන පිටුව - මූලික ප්‍රශ්න.

ප්‍ර : මෙම ඉල්ලුම්කාරිය මෙම ආවරණ තනතුරේ අවුරුදු කිහිපයක් කටයුතු කරලා තියෙනවා. අවම වශයෙන් මානුෂීය වශයෙන් හෝ ස්ථිර කිරීමට කටයුතු කළා ද?

පි : කටයුතු කළා

ප්‍ර : කොහොමද කළේ කියලා විස්තර කරන්න ?

පි : තව පිරිසක් හිටියා. විනය විභාග නිලධාරි V ශ්‍රේණියේ ආවරණ පත්වීම ලබා තිබූ අය. නමුත් ඒ අයව එම තනතුරේ ස්ථිර කිරීම සඳහා මා විසින්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්මික ආරාවුල් සමථ කිරීමේ කමිටුවට මේ අය සම්බන්ධයෙන් දැනුම්දීමක් සිදු කළා.

2024.04.08 වැනි දින සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා - කාර්යය පැවරුම්) 13 වන පිටුව - මූලික ප්‍රශ්න.

ප්‍ර : ගරු අධිකරණයට කියා සිටින්න කමිටු තීරණයේ පැමිණිල්ලේ ස්වභාවය කොහොම ද කියලා ?

පි : 2013 අංක 5 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ චක්‍ර ලිපිය අනුව 5 ශ්‍රේණියේ විනය විභාග නිළධාරි තනතුරට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉන් සමත් වූවන්ට තනතුරට අදාළ ආවරණ පත්වීමක් පමණක් ලබාදීම තුළින් ශ්‍රේණියේ හා වැටුපෙහි කිසිදු වෙනසක් සිදුනොවීම හේතුවෙන් 5 ශ්‍රේණියේ විනය විභාග නිළධාරි ස්ථිර තනතුරට පත්කොට වැටුප් ලබා ගැනීම

ප්‍ර : එයට කමිටුවෙන් ලබාදුන් නිර්දේශය කියවන්න

පි : අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන උපරිමාධිකරණයට මෝසමක් ගොනුකර උසාවියෙන් අනුමැතියක් ලබාගෙන අනතුරුව ඉදිරි කටයුතු කළ යුතු බවට තීරණය විය.

ඉල්ලුම්කාරිය අදාළ V ශ්‍රේණියේ ස්ථිර කිරීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තියක් බව ඉන් ගම්‍ය වේ. විශේෂයෙන් ඇය වගඋත්තරකාර ආයතනයේ ආවරණ පත්වීමේ සේවය කළ වසර 10ක කාලය තුළ රාජකාරිය ඉතා දුෂ්කර නමුත් වගකීමෙන් සහ කිසිදු දීමනාවක් නොමැතිව වුවද ඉටුකර ඇති බව පෙනී යයි. නැගෙනහිර පළාත තුළ දෙමළ බස ද මනාව හසුරවමින් ඇය මුල් ශ්‍රේණියේ සිට මේ දක්වා පැමිණි බවට ලබාදුන් සාක්ෂි වගඋත්තරකරු විසින් අභියෝගයට ලක්නොකිරීමෙන්ම එය පසක් වේ. සමස්ථයක් ලෙස ගත්කළ ඉල්ලුම්කාරියගේ සේවය හා එහි කාර්යක්ෂමතාව කිසිවිටෙක වගඋත්තරකරු විසින් අභියෝගයට ලක්කර නොමැත.

ඒ අනුව, ඉල්ලුම්කාරිය V ශ්‍රේණියේ විනය විභාග නිලධාරි තනතුරේ ස්ථිර කළ යුතු ද? ඉල්ලුම්කාරිය V වන ශ්‍රේණියට අදාළ වැටුප හිමි ද? හිඟ වැටුප් පවතී ද? සහ එකී උසස්වීම සහ වැටුප් මෙතෙක් ලබානොදීම මගින් ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්න විශ්ලේෂණය කළ යුතුය.

වගඋත්තරකරුට අනුව ඉල්ලුම්කාරියට සේවය ස්ථිර කිරීමට ආයතන බාධා 2ක් පවතී.

1. වගඋත්තරකාර ආයතනයට එරෙහිව ලැබී ඇති අධිකරණ නියෝගය
2. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුගත කිරීමේ අවසන් අදියරේ පසුවීම.

1. *වගඋත්තරකාර ආයතනයට එරෙහිව ලැබී ඇති අධිකරණ නියෝගය*

වගඋත්තරකරුට එරෙහිව පවතින ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවල දී ලබා දී ඇති අතුරු නියෝග අනුව ආයතනය අවහිරයකින් තොරව පවත්වාගෙන යාම සඳහා පහත කොන්දේසිවලට යටත්ව ආවරණ ලිපි ලබාදිය හැකි බව තීරණය කර ඇති බව වගඋත්තරකරු ප්‍රකාශකර සිටී.
එනම්,

01. එකී පත්වීම් ලබාදීමට පවතින සේවා අවශ්‍යතාවය.
02. එම පත්වීම් උසස්වීමක ස්වභාවයක් නොදැරිය යුතුය.
03. එම පත්වීම මගින් වැටුප් වැඩිවීමක් නොවිය යුතුය.
04. එම පත්වීම් ලබාදීමට පෙර කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුවේ පූර්ව අනුමැතිය ලබානොගන්නේ නම් එලෙස පත්වීම් ලබාදුන් ලැයිස්තුව මීළඟ නඩු දිනයට සතියකට පෙර මෝසමක් මගින් අධිකරණයේ ගොනුකළ යුතුවේ.

එකී අතුරු නියෝග අනුව, එකී නියෝගවල කාලවකවානුවට අදාළව එනම් 2019.07.17, 2019.09.24 යන දිනවලට පසු අදාළ ආවරණ පත්වීම් ලබාදීම සම්බන්ධයෙන් පමණක් එකී නියෝග බලපාන නමුත්, අතීතයට බලනොපැවැත්වේ. ඉල්ලුම්කාරිය සම්බන්ධ කාරණාවේදී ඉල්ලුම්කාරියගේ ආවරණ පත්වීමේ ලිපිය නිකුත්කර ඇත්තේ ඊට වසර ගණනාවකට පෙර 2013.12.23 වැනි දින අතර, ඇයගේ පත්වීම ස්ථිර වියයුතු නම් එය සිදුවිය හැකිව තිබුණේ ද, ඇය සමග 2013.12.23 දින සිට විනය විභාග නිලධාරි තනතුර ආවරණය කළ අනෙක් සිව්දෙනා එම තනතුරේ ස්ථිර කරන ලද 2018.08.01 දින පටන්ය (පැ. 17 ලේඛනය ප්‍රකාරව). ඉල්ලුම්කාරියගේ ගැටළුවට අදාළ 2013.12.23 සිට 2018.08.01 දක්වා වන කාල පරාසය කිසිවිටෙක ඉහත කී අතුරු නියෝගය හා බැඳීමක් නැත.

2024.04.08 වැනි දින සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා - කාර්යය පැවරුම්) 24-25 වන පිටුව - හරස් ප්‍රශ්න.

ප්‍ර : සාක්ෂිකරු ආර්12 ලේඛනය අනුව ශ්‍රේෂ්ඨාධිකරණ නියෝග හරය වෙන්නේ ආර්12 තියෙන්නේ ආවරණ පත්වීම් තවදුරටත් කලාට කමක් නැහැ කියලානේ එය පිළිගන්නවානේ ?

පි : ඔව්

ප්‍ර : එම ඉදිරියට කරන ආවරණ පත්වීම් උසස්වීමකට හෝ වැටුප් වැඩිවීමකට හේතු වන්න බැහැ කියලා මේ නඩු තීන්දුවේ දිනය 2019.09.24 පිළිගන්නවානේ ?

පි : ඔව්

ප්‍ර : 2019.09.24 පස්සේ කළ යුතු ආවරණ පත්වීම් ගැන කියන්න ?

පි : ඔව්

ප්‍ර : ඒ වන විට කර ඇති පත්වීම් ගැන සඳහන් වෙනවා ද?

පි : නැහැ

ඉල්ලුම්කාරිය වෙත නිකුත්කර ඇති ඉහත කී පත්වීමේ ලිපියේ වැටුප් වැඩි කිරීමක් හෝ ශ්‍රේණියේ කිසිදු වෙනසක් සිදුනොවන බව සඳහන්කර ඇති බවත්, ඉල්ලුම්කාරිය ඉන් බැඳී පවතින බවත්, වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිය ද, වගඋත්තරකරු විසින් උසස්වීම් හෝ සේවය ස්ථිර කිරීම් සම්බන්ධයෙන් ඉහත කී නඩු නියෝගය ඉල්ලුම්කාරියගේ කාරණාවට අදාළ කරගනුයේ කෙසේදැයි සාක්ෂි මගින් තහවුරු කර නොමැත.

2024.04.08 වැනි දින සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා - කාර්යය පැවරුම්) 24-25 වන පිටුව - හරස් ප්‍රශ්න අවසානයේ බේරුම්කරු විසින් අසල ලද ප්‍රශ්න.-

ප්‍ර : ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරි ආවරණ තනතුරක ස්ථිර කිරීම නව උසස්වීමක් ලබාදීමක් විදිහට අර්ථකථන කරන්න පුළුවන් ද?

උ : ඒ පිළිබඳව දැනුමක් නැහැ

ප්‍ර : ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේ කියලා තියෙනවා මේ නඩුව ගොනුකර පාර්ශ්වය නඩුවේ පැමිණිලිකරුවන් ඇයි මේ නඩුව ගොනු කළේ ආර්12 ලේඛනයට අදාළ නඩුව?

උ : අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලබා දී තිබූ උසස්වීම් සම්බන්ධයෙන්

ප්‍ර : සාක්ෂිකරු ආර්12 ලේඛනය අනුව ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය හරය වෙන්නේ ආර්12 තියෙන්නේ ආවරණ පත්වීම් තවදුරටත් කළාට කමක් නැහැ කියලානේ එය පිළිගන්නවානේ ?

උ : ඔව්

ප්‍ර : එම ඉදිරියට කරන ආවරණ පත්වීම් උසස්වීමකට හෝ වැටුප් වැඩිවීමකට හේතු වන්න බැහැ කියලා මේ නඩු තීන්දුවේ දිනය 2019.09.24 පිළිගන්නවානේ ?

උ : ඔව්

ප්‍ර : 2019.09.24 පස්සේ කළ යුතු ආවරණ පත්වීම් ගැන කියන්නේ ?

උ : ඔව්

ප්‍ර : ඒ වන විට කර ඇති පත්වීම් ගැන සඳහන් වෙනවා ද?

පි : නැහැ

2. *කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග සේවකයන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුගත කිරීමේ අවසන් අදියරේ පසුවීම*

R10 ලිපිය ලකුණු කරමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ආයතනික ව්‍යුහය සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කරගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමග කටයුතු කරමින් පවතින බවත්, සේවකයින් බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය අනුමත කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් අදියරේ පවතින බවත්, එබැවින් මෙම අවස්ථාවේ දී මෙම ක්‍රියාවලියට බාහිරව හෝ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව උසස්වීම් ලබාදීමට හැකියාවක් නොමැති බව ප්‍රකාශ කර ඇතත්, වගඋත්තරකරුගේ එම ස්ථාවරය සාක්ෂි ලබාදීමේ දී ඊට පටහැනි සාක්ෂි ලබාදෙමින් වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂි ලබා දුන් සාක්ෂිකරු විසින්ම බිඳහෙළා ඇති බව පහත උපුටා දැක්වීම් මගින් පැහැදිලිව පෙනී යයි.

2024.04.08 වැනි දින සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා - කාර්යය පැවරුම්) 18 වන පිටුව - හරස් ප්‍රශ්න

ප්‍ර : මේ තනතුර දීලා තියෙන්නේ කවද්ද සාක්ෂිකරු ?

උ : 2013.12.23

ප්‍ර : ඊට අවුරුදු කීයකට පසුව ද රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ R10 ලේඛනය නිකුත් වුනේ ?

උ : අවුරුදු 5කට පමණ පසුව

ප්‍ර : එම අවුරුදු 5 කාලය තුළ ඉල්ලුම්කරු එම තනතුරේ සේවය කරලා තියෙනවා ද ?

උ : ඔව්

ප්‍ර : නමුත් ඇයට එම තනතුරේ වැටුප් ගෙවලා තියෙනවා ද ?

උ : නැහැ

වගඋත්තරකරුගේ විත්තිවාචක / ස්ථාවරයන්හි ප්‍රබලත්වය ඇතැම් අවස්ථාවල එකී සාක්ෂිකරු විසින්ම බිඳහෙළා ඇත. ඉල්ලුම්කාරියගේ පත්වීම ස්ථිර කිරීමට ඉහත කී පරිදි බාධා දෙකක් පවතින බව පැවසුව ද, ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය හැර වෙනත් බාධාවක් නොමැති බව එක් අවස්ථාවක ප්‍රකාශ කර ඇත.

2024.04.08 වැනි දින සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා - කාර්යය පැවරුම්) 15-16 වන පිටුව - මූලික ප්‍රශ්න

ප්‍ර : මෙම අතුරු නියෝගයට අමතරව ආයතනයට මෙම ආවරණ තනතුර ස්ථිර කිරීමට වෙනත් බාධා තිබුණා ද ?

උ : නැහැ

ප්‍ර : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් දුන් නියෝගය කුමක් හැටියට ද සලකන්නේ ?

පි : 2018.10.01 දින සිට උසස්වීම් ලබාදීම සිදුනොකළ යුතුයි කියලා දැනුම් දීලා තියෙනවා.

ප්‍ර : අපි ලකුණු කරන ලද R11 ලේඛනයේ තියෙන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තීරණයක් ගත්ත කියලා ?

පි : ඔව්

ප්‍ර : අධ්‍යක්ෂ මණ්ඩලයට කම්ටු නිර්දේශය දැනුම් දුන්නද අනුමැතියක් ගත්ත ද?

පි : මා විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් සැකසුවා ශ්‍රීලංගම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළා.

ප්‍ර : තීරණයක් ඔබ සතුව තිබෙනවා නම් ගරු අධිකරණයට පෙන්වා සිටින්න

පි : එය ඉදිරිපත් කර සිටී

ප්‍ර : පත්‍රිකා අංකය හා දිනය කවද්ද ?

පි : 2022.11.02 දින කොස්වත්ත මග නැගුම මහ මැදුර ශ්‍රවණාගාරයේ දී පැවැති 2022 වර්ෂයේ 9 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම, එහිදී පත්‍රිකා අංක 115 අනුව

ප්‍ර : තීරණය මොකක් ද?

පි : කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය අනුමත කිරීමෙන් පසු නියමිත ශ්‍රේණියේ පිහිටුවීම තීරණයක් ගතයුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී.

කෙසේ නමුත්, විනය විභාග නිලධාරි තනතුර V ශ්‍රේණිය සඳහා අයැදුම්පත් කැඳවීමේ දී එකී චක්‍රලේඛයේ එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් 1.6 යටතේ අයදුම්පතක් යොමුකොට ඇති ඉල්ලුම්කාරිය බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ද සමත්ව විනය විභාග නිලධාරි ආවරණ තනතුරට පත්ව වසර 10කට ආසන්න කාලයක් එකී තනතුරට අදාළ කාර්යයන් නිසි වැටුප හෝ දීමනා නොලබමින් වුවද සිදුකර, එකී තනතුරට අදාළ සියලු කැඳවීම් ලිපි වගඋත්තරකරු විසින් ඇය වෙත යොමුකිරීම මගින් ද ඇයට එකී නිලයේ පිළිගෙන ඇති හෙයින් ඉල්ලුම්කාරියගේ තනතුර V ශ්‍රේණිය විනය විභාග නිලධාරි (ස්ථිර) ලෙස උසස් වියයුතු බව තීරණය කරමි.

එසේම, එකී කාලය තුළ වෙනත් නිලධාරීන්ගේ පත්වීම්ද උසස්කර ඇතිබව සහ ඔවුන්ගේ වැටුප් වැඩිකර ඇතිබවද, ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිර නොකිරීමෙන් සහ ඇයගේ වැටුප් වැඩි නොකිරීමෙන් ඇයට අසාධාරණයක් සිදුවී ඇති බවද, නිලධාරීන් උසස් කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු සතුව නිසි ක්‍රමවේදයක් නොමැති බවද නිරීක්ෂණය කරමි. නිසි ක්‍රමවේදයකට අනුව උසස්වීම් සිදුනොකරන බවට වගඋත්තරකරු පිළිගෙන ඇති විටෙක 2017 චක්‍රලේඛය ප්‍රකාරව ඉල්ලුම්කාරිය විනය විභාග නිලධාරි තනතුරට නැවත අයදුම් නොකළේය යන පදනමින් පමණක් ඇය එම තනතුරට උසස්කර ස්ථිර නොකිරීම සාධාරණ නොවේ. ඉල්ලුම්කාරිය නිසි පරිදි 2013 චක්‍රලේඛය ප්‍රකාරව අයදුම්කර සම්මුඛ පරීක්ෂණයෙන් සමත්ව පත්වීමක් ලබා, එම තනතුරේ කාර්යය අදටත් නොපිරිහෙලා සිදුකරන බැවින් සහ 2017 චක්‍රලේඛය ප්‍රකාරව විනය විභාග නිලධාරි තනතුරේ ස්ථිර කිරීමට අවශ්‍ය සුදුසුකම් යටතේ ඉල්ලුම්කාරිය සපුරනලද සුදුසුකම 2013 චක්‍රලේඛයට වඩා කිසිසේත් නොවනස් හෙයින්, එකී සුදුසුකම් 2013 වසරේ ඉල්ලුම්කාරිය අයදුම් කරනවිට වඩා 2017 වනවිට සපුරනලද බැවින් ඉල්ලුම්පත්‍රයක් නැවත යොමු නොකිරීම මතම ඇයට අයුක්තිසහගත හා අසාධාරණ වෘත්තීය පරිචයක් අත්නොවිය යුතුය.

2024.04.08 වන දිනැති සටහන්, ඩී. එස්. තුඩුගල මහතා, නියෝජ්‍ය මානව සම්පත් කළමනාකාර (කම්කරු සබඳතා-කාර්යය පැවරුම්) 15-18-19 වන පිටුව - හරස් ප්‍රශ්න

ප්‍ර : ඉල්ලුම්කරුව මණ්ඩලීය ක්‍රියාපටිපාටියට අනුව සම්මුඛ පරීක්ෂණයක් තියලාද බඳවාගෙන තියෙන්නේ ?

පි : ඔව්

ප්‍ර : ඉල්ලුම්කාරිය තනතුරට පත්කිරීමෙන් අනතුරුව නැවත එම තනතුරට පරික්ෂණ තියලා පත්කරගෙන තියෙනවද ?

පි : ඔව්

ප්‍ර : එම තනතුරුවල ස්ථිර කරලා තියෙනවද ?

පි : ඔව්

ප්‍ර : ආර් 11 ලේඛනය අනුව කවදාද ඔය අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වෙන්නේ ?

පි : ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්මික ආරාවුල් සමථ කිරීමේ කමිටුව. මෙම කමිටු රැස්වීම 2021.12.21

ප්‍ර : ඉල්ලුම්කාරිය තනතුරට පත්වෙලා වසර කීයකට පසුවද?

පි : වසර 9කට පසුව

ප්‍ර : වසර 9කට පසුව ඉදිරිපත් කරන්නේ ?

පි : ඔව්

ප්‍ර : වෙනකොට විභාග නිලධාරීන් බඳවාගෙන ස්ථිරකර තිබුණ ද ?

පි : ඔව්

ප්‍ර : ඉල්ලුම්කාරිය බඳවාගත්තට පසුව තමයි ඒ තනතුරු දීලා තියෙන්නේ ?

පි : ඔව්

ඉහත සඳහන් කළ පරිදි උත්තරවාදවල සඳහන් කරුණු සහ සාක්ෂි විභාගයේදී ඉදිරිපත්වූ කරුණු අනුසාරයෙන් විමසා බලන විට අනෙකුත් නිලධාරීන්ගේ තනතුරු ස්ථිර හෝ උසස්කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරු ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/239/2019 හිදී 2019.07.17, 2019.09.24 යන දිනවලදී ලබාදී ඇති අතුරු නියෝග අදාල කරගෙන නොමැති බවත්, ඉල්ලුම්කාරියගේ සේවය ස්ථිර කිරීම සම්බන්ධයෙන්ද එකී අතුරු නියෝග අදාළ නොවන බවට සාක්ෂි ලබාදී ඇති බවත්, කළමනාකරණ සේවයේ උසස්වීම් හා සේවයට බඳවාගැනීමේ පටිපාටිය අනුගත කරගැනීමට තීරණයවූ කාලය ඉල්ලුම්කාරිය ස්ථිරකළ යුතු දිනට පසුව පැනනැගි කරුණක් බව ඉතා පැහැදිලි බැවින් ඉල්ලුම්කාරියගේ පත්වීම ස්ථිර නොකිරීමෙන් සහ එම තනතුර සඳහා හිමිවියයුතු වැටුප ලබානොදීමෙන් ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී ඇති බවටත්, ඇගේ තනතුර 2018.08.01 දින සිට ස්ථිර වියයුතු බවටත්, ඒ අනුව ඇයගේ ශ්‍රේණිය V වන ශ්‍රේණිය දක්වා උසස්කළ යුතු බවටත්, එම තනතුර සඳහා ලැබිය යුතු වැටුප හිමිවිය යුතු බවටත් තීරණය කරමි.

එසේම පහත නඩුතීන්දු මගින්ද සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බව පෙන්වාදී ඇත.

*Ramupillai vs Minister of Public Administration, Provincial Councils and Home affairs & others 1991 (1) Sri L.R at 44* දරන නඩුවේදී රණසිංහ අගවිනිසුරුතුමන් විසින් නඩු තීන්දු ගණනාවක් උපුටා දක්වමින්, සේවක අයිතීන් අභිමුව නීතිය පසිඳලීම (equality before law) සහ නීතියේ රැකවරණය (equal protection of law) යන සංකල්ප මනාව විග්‍රහකර ඇත. ඒ අනුව, *State of Kerala vs. Thomas and others IR 1976 SC 490, Probhudas Morarjee vs. union of India AIR 1966 SC 1044, Railway Express Agency vs. New York (1949) 336 US 100, S.C. Perera vs. University Grants Commission S.C. Application No.88 of 1980* යන නඩු තීන්දු ගෙනහැර දක්වමින් තීරණයකර ඇත්තේ සමාන සුදුසුකම් හා සමාන අවස්ථා හිමි තැනැත්තන්ට වෙනස් කොට සැලකීම සහ අසාධාරණ වර්ගීකරණයන් සිදුකිරීම සිදුනොකළ යුතු බවයි. එහිදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රකාර සමානාත්මතාව යන්න විමසා ඇත.

"*The provisions of Article 12(1) and (2) bring within their reach equality of opportunity for employment as well and that such guarantee of equality applies not only in the matter of selection for employment, but also at the stage of selection for promotion*"

තවද, රාජ්‍ය සේවයේ සමාන අවස්ථා සැලසීම සේවයට තෝරා ගැනීමේදී මෙන්ම යම් තනතුරුවලට උසස් කිරීමේදීද තහවුරු වියයුතු බව එකී නඩුවේදීම *Seervai, Constitutional Law of India, Volume 1, 3rd Edition* හි 423 වන පිටුව උපුටා දක්වමින් තීරණයකර ඇත.

"*Equality of opportunity in matters of public emploment cannot be confind to the initial matters prior to the act of employment, but include other matters relating to emploment, such as promtion to selected posts.*"

02. ඉල්ලුම්කාරියට හිමිවියයුතු සහන කවරේද ?

ඉහත සාක්ෂි සම්පිණ්ඩනය මත ඉල්ලුම්කාරිය නිසි ශ්‍රේණියේ පිහිටුවා නොමැති බව වැඩිබර සාක්ෂි සහ පිළිගත් කරුණු මත ඔප්පුකොට ඇති නමුත්, ඉල්ලුම්කාරියට හිමිවිය යුතු වැටුප් සම්බන්ධයෙන් ඉදිරිපත්කර ඇති සාක්ෂි මත යම් පරිස්පරතා හටගෙන ඇත. එසේ හෙයින් නිසි තනතුරේ මූලික වැටුප හිමිවිය යුතු වුවද, වැටුප් විෂමතාවක් සිදුව ඇත්ද, කිනම් දිනක සිට නිසි වැටුප් හා දීමනා හිමිවිය යුතුද යන වග විශ්ලේෂණය කර බැලියයුතු වේ.

ඉල්ලුම්කාරිය 2013.12.23 දින සිට විනය විභාග නිලධාරී තනතුරේ ස්ථිරකළ යුතු 2018.08.01 දින දක්වා VIII B ශ්‍රේණියට අදාල වැටුප් පමණක් ගෙවා ඇති නමුත්, විනය විභාග නිලධාරී තනතුරේ වැඩ ආවරණය සහ/හෝ රාජකාරිය සිදුකිරීම වෙනුවෙන් කිසිවිටෙක වෙනත් දීමනාවක් ලබාදී නොමැත.

2024.04.08 වන දිනැති සටහන්, ඩී.එස්.තුඩුගල මහතා, නියෝජ්‍ය මානව කළමනාකාර (කම්කරු සබඳතා-කාර්යය පැවරුම්) 8 වන පිටුව - මූලික ප්‍රශ්න

ප්‍ර : මේ ලෙස ලබාදෙන ආවරණ පත්වීම්වලට වැටුපේ වෙනසක් සිදුවෙනවද ?

පි : වැටුපේ වැඩිවීමක් සිදුවෙන්නේ නැහැ. රාජකාරියේ ස්වභාවය අනුව දීමනාවක් ලබාගැනීමේ හැකියාව තියෙනවා.

ප්‍ර : මේ ඉල්ලුම්කාරිය අදවනතුරු සේවාවක් සපයලා තියෙනවා. ඇය ලබන වැටුප මොන තනතුරේ හා මොන ශ්‍රේණියේ වැටුප ද ලබාගෙන තියෙන්නේ ?

පි : යතුරු ලිපිකාරිනියක් ලෙස සේවයට එකතු වන්නේ. ඒ අනුව යතුරු ලිපිකාරිණී හැටියට VIII B ශ්‍රේණියේ වැටුප ලබා දීලා තියෙනවා.

ඉල්ලුම්කාරිය 2013.12.23 දින සිට විනය විභාග නිලධාරී ආවරණ තනතුරේ සේවයකළ නමුත් ඇයට VIII B ශ්‍රේණියේ යතුරු ලිපිකාරිණියකට හිමි වැටුප පමණක් මේවන තෙක් ලබාදී ඇතිබව වගඋත්තරකරු සාක්ෂි මගින් තහවුරුකර ඇත. යම් කාර්යයක් යමෙකු විසින් වගකීම් සහගතව ඉටු කිරීමේදී එය ඇගයීමක් ලෙස ඊට අදාල යම් දීමනාවක් ඇත්නම් එය නිසැකව හිමිවිය යුතුය.

එසේම යමෙකු ඉහළ නිලයක වගකීම් සඳහා අයදුම් කරනු ලබන්නේද පවතින වැටුපට අමතර යමක් ලැබෙනු ඇත යන සාධාරණ අපේක්ෂාවෙන් යුක්තවය. ඒ අනුව, ඉල්ලුම්කාරිය V ශ්‍රේණියේ විනය විභාග නිළධාරී ආවරණ තනතුරේ නියුතු වීම වෙනුවෙන් හිමිවිය යුතු දීමනාවක් පවතී නම් අදාල දීමනාව 2013.12.23 දින සිට 2018.08.01 දක්වා වන කාලය සඳහා ලබාදිය යුතු බව තීරණයකළ හැකි නමුත්, එලෙසින් ලබාදෙනු ලබන දීමනා මුදල් පිළිබඳ ඉල්ලුම්කාරිය හෝ උගඋත්තරකරු විසින් නිසි පරිදි ඔප්පුකර නොමැති හෙයින් අදාල දීමනාවක් සම්බන්ධව ප්‍රදානයක් ලබාදිය නොහැක.

එසේම, පෙර කී පරිදි ඉල්ලුම්කාරිය V ශ්‍රේණියේ විනය විභාග නිලධාරී තනතුරේ ස්ථිර කළයුතු 2018.08.01 සිට අදවනතෙක් වැටුප් විෂමතාවක් පවතීද යන කාරණය වඩාත් තහවුරු කරගැනීම පිණිස ඉල්ලුම්කාරියගේ වැටුප් සම්බන්ධයෙන් සාක්ෂි ලබාදුන් ප්‍රාදේශීය මුදල් කළමණාකාර සමන් බණ්ඩාර මහතාගේ සාක්ෂිය පහත පරිදි සංක්ෂිප්තකර ඇත.

| *වර්ෂය (මූලික වැටුප සෑම වසරකම අවසානයේ ගණනය කරනු ඇත)* | *VIII B ශ්‍රේණිය යතුරු ලිපිකාරිණී මූලික වැටුප* | *V ශ්‍රේණිය මූලික වැටුප* | *වැටුප්තල වෙනස* |
|---|---|---|---|
| 2013 | 13,865/- | - | - |
| 2014 | 14,451/- | 14,060/- | 391/- |
| 2015 | 15,910/- | 14,300/- | 1,610/- |
| 2016 | 16,055/- | 14,780/- | 1,275/- |
| 2017 | 16,200/- | 15,500/- | 700/- |
| 2018 | 16,345/- | 16,500/- | -155/- |
| 2019 | 16,490/- | 17,700/- | 391/- |
| 2020 | 16,635/- | නිශ්චිතව කිවනොහැකි බව කියා සිටී. | -1,210/- |
| 2021 | 16,780/- | | |
| 2022 | 16,925/- | | |
| 2023 | 35,710/- | | |

වැටුප්තල වෙනස බැලුකල, 2018 වසර අවසානයතෙක් ඉල්ලුම්කාරියට VIII B ශ්‍රේණියේ මූලික වැටුප හිමිවීම මගින් වැටුප් විෂමතාවක් හටගෙන නොමැති බව පෙනී යන අතර, 2018 වර්ෂය අවසානයේ පටන් වැටුප් පරතරයක් පෙන්නුම් කරයි. මේවනතෙක් ඉල්ලුම්කාරියට VIII B ශ්‍රේණියට අදාළ වැටුප් ගැටළුවකින් තොරව ගෙවා ඇති බවද පෙනී යයි. කෙසේ නමුත්, වගඋත්තරකරුට හෝ ඉල්ලුම්කාරියට 2020-2023 දක්වා වන වැටුප්තල වෙනස නිසිපරිදි සාක්ෂි මගින් ඔප්පුකරලීමට නොහැකිවී ඇති හෙයින් 2018 වර්ෂයේ සිට හිඟ වැටුප් නිවැරදිව හා නියමානුකූලව ගණනය කිරීමට නොහැක.

එබැවින්, ඉල්ලුම්කාරිය 2018.08.01 දින සිට V ශ්‍රේණියේ විනය විභාග නිලධාරී තනතුරේ ස්ථිර පත්වීම ලැබිය යුතු බවට තීරණය කරන අතරම, V වන ශ්‍රේණියට නියමිත වැටුප, දීමනා හා වරප්‍රසාද මෙම ප්‍රදානයේ දින පටන් ඉල්ලුම්කාරිය වෙත ගෙවන ලෙසටද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට නියෝග කරමි. මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

ගැසට් ගත කිරීමෙන් මසක් ඇතුළත මෙම ප්‍රදානය ක්‍රියාත්මක කර ඒ බව නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කිරීමට නියම කරමි. අනෙකුත් ව්‍යවස්ථාපිත හිමිකම් ලබා ගැනීමට මෙය බාධාවක් නොමැති බව සඳහන් කරමි.

(බණ්ඩාර සෙනරත්)
බේරුම්කරු.

2024 ජුනි මස 18 වැනි දින.

EOG 10 - 0115

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.